## නර්තන කලාව හා බැඳි ඓතිහාසික පසුබිම

නර්තන කලාවේ ආරම්භය කෙදිනක සිදු වී ඇත් දැයි අපට නිශ්චිත ව ම නිගමනයකට එළඹිය නොහැකි ය. එහෙත් එය මිනිස් සංහතියේ ආරම්භය තෙක් ඈතට දිව යන බව පෙනේ. ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ විමසීමේ දී එය විවිධ කාල වකවානුවල විවිධ ස්වරූපයෙන් පැවති ඇති බව ඒ පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී විද්‍යමාන වේ. මෙම කාල වකවානු යුග වශයෙන් වෙන් කොට දැක්විය හැකි ය.

1. ප්‍රාග් බෞද්ධ යුගය
2. අනුරාධපුර යුගය
3. පොළොන්නරු යුගය
4. දඹදෙණි යුගය
5. කුරුණෑගල යුගය
6. ගම්පොළ යුගය
7. කෝට්ටේ යුගය
8. මහනුවර යුගය
9. කොළඹ යුගය

වංශකතා, පුරාවිද්‍යාත්මක සාධක, ශිලා ලේඛන, විදේශිකයන්ගේ වාර්තා, සාහිත්‍ය කෘති වැනි මූලාශ්‍රය මඟින් හා ජනප්‍රවාද හා ජනශ්‍රැති මඟින් එකල තිබූ නර්තන කලාව පිළිබඳ බොහෝ තොරතුරු අපට සැපයේ.

## විදේශිකයන්ගේ ඓතිහාසික වාර්තා

විවිධ යුගයන්හි දී ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය සංචාරකයන් අතරින් ඉබන් බතූතා, රොබට් නොක්ස්, ස්පිල් බර්ජන්, ෆාහියන් යන ගත්කරුවන් ඔවුන්ගේ කෘති මඟින් නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරණය කොට ඇත. 14 වන සියවසේ දී, පමණ එනම් ගම්පොළ යුගයේ දී ශ්‍රී ලංකාවට පැමිණි ඉබන් බතූතා නැමැති සංචාරකයාගේ වාර්තාවේ සඳහන් වන්නේ දෙවුන්දර උපුල්වන් දේවාලයයේ මිනිස් ප්‍රමාණ උස දෙව්රුවක් අබියස පන්සියයක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බව යි. (විදේශීන් දුටු පුරාණ ලංකාව) මෙහි සඳහන් ආකාරයට හින්දු බාලිකාවන් නටන ලද්දේ දෙව්රුව ඉදිරියෙහි ය. මේ කරුණු මඟින් පැහැදිලි වන්නේ එම යුගයේ නර්තන කලාවට භාරතීය ආභාසය ද ලැබී ඇති බව යි.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

මහනුවර යුගයේ (ක්‍රි.ව. 1592 - 1604) විමලධර්මසූරිය රජ සමයේ ලංකාවට පැමිණි ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් මහනුවර පෙරහැරේ නැටුම් පිළිබඳ මෙසේ ලියා ඇත.




ස්පිල් බර්ජන්

"මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සණට නටත් . ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර, යටිකයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේ ය."

මහනුවර යුගයේ II (දෙවන) රාජසිංහ රජ සමයේ (ක්‍රි.ව. 1636- 1686) ලංකාවට පැමිණ වසර 18ක් පමණ ලංකාවේ සිරකරුවකු ලෙස සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් එදා හෙළදිව නම් තම ග්‍රන්ථයේ ඇසළ පෙරහැර පිළිබඳ වත්, එහි නේවාව පිළිබඳ වත් මෙසේ සඳහන් කර ඇත.

"එහි දේවාල විහාරවල නේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙත්. ඔවුන් හට නියම වූ විවිධ ක්‍රීඩා කරමින් තුන් දෙනා බැගින් අතිනත ගෙන රඟන ස්ත්‍රීහු වෙති."

- **නර්තන පිළිබඳ තොරතුරු (වංශකථා ඇසුරෙන්)**

ශ්‍රී ලංකාවේ විවිධ යුගයන්හි පැවති නර්තන කලාව පිළිබඳ තොරතුරු රාශියක් මහාවංශය, දීපවංශය, ථූපවංශය, චූලවංශය යන වංශ කතා මගින් හෙළි කර ගත හැකි ය.

- **මහාවංශයේ සාධක**

ප්‍රාග් බෞද්ධ යුගයේ නැටුම්, ගැයුම්, වැයුම් පැවති බවට නිශ්චිත සාධක අපට හමු නොවෙතත්, ධාතුසේන රජ සමයේ රචිත මහාවංශයේ සඳහන් යම් යම් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු අනාවරණය කර ගත හැකි ය. එහෙත් මෙහි සඳහන් බොහෝ තොරතුරු ජනප්‍රවාද හා බැඳී ඇති බැවින්, ඉතිහාසඥයෝ එම තොරතුරු සියල්ල සත්‍ය ලෙස පිළිගැනීමට කැමැත්තක් නො දක්වති. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ආදි ම වැසියන් ලෙස යක්ෂ හා නාග වශයෙන් ගෝත්‍රික කොටියාස දෙකක් සිටි බව පැහැදිලි කරුණකි.

**මහාවංසයේ සඳහන් තොරතුරු අනුව බලන කල.**

- විජයාවතරණයටත් පෙර සිට ම ලංකාවේ විසූ මෙම ගෝත්‍රිකයෝ දියුණු සංස්කෘතික ලක්ෂණවලින් හෙබි අය වූහ. විජය හා කුවේණී එක් වූ දින රාත්‍රියේ සිරීසවත්පුරයේ පැවති විවාහ මංගල උත්සවයක නැටුම්, තූර්යවාදන හා ගීත ගායනා පැවැත්වී ඇත.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

- අනුරාධපුර යුගයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ පණ්ඩුකාභය රජු ය. මේ යුගයේ නැටුම්, ගැයුම් හා පුද පූජා ආදිය පැවැත්වූ බවට තොරතුරු මහාවංශයේ ඇත. එහි සඳහන් වන්නේ, උත්සව අවස්ථාවල දී පණ්ඩුකාභය රජු චිත්තරාජ හා කාලවේල යන යක්ෂයන් උදෙසා සම අසුන් පනවා තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව යි.

- (ක්‍රි.පූ. 1611 - 137) දුටුගැමුණු රජු තළගනන් පිරිවරා ගෙන කණ්ඩුල ඇතු පිට නැගී රුවන්වැලිසෑයේ ධාතු නිදන් කිරීමේ උත්සවයට පංචතූර්ය වාදන සහිත ව ගිය බව සඳහන් වේ.

- (ක්‍රි.පූ. 9 - 21) මහා දාඨික මහානාග හෙවත් මහා දළියාමාහා රජු ගිරි භණ්ඩ නම් පූජාවක් කළ බව මහාවංශයේ සඳහන් ව ඇති අතර, එම උත්සවයේ දී විදි සරසා, සතර දොරටු සරසා, තැන තැන තොරණ, ධජ බඳවා, පහන් දල්වා, නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වූ බව හා මෙම උත්සවයට රනින් කළ බෙර අටක් වාදනය කරන මෙන් රජතුමා නියෝග කළ බව ද පැවසේ.

- භාතිකාභය රජු බෝධි ස්නාන පූජාවක් (නානු මුර මංගල්‍යයක්) මහා බෝධියට පැවැත්වූ බවත්, එහි දී නැටුම් හා තූර්ය වාදන ද පැවැත්වූ බවත් මහාවංශයේ සඳහන් වේ.

- මහාවංශයේ තොරතුරු අනුව පොළොන්නරුවේ (ක්‍රි.ව. 1153 - 1186) රජ කළ මහා පරාක්‍රමබාහු රජු නැටුම්, ගැයුම් සඳහා විශාල ලෙස රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් රජ කෙනෙකි. මෙතුමා නැටුම්, ගැයුම්, වැයුම් සඳහා සරස්වතී මණ්ඩපය ඉදි කළ බවත් එහි දක්ෂ නළු නිළියන් යෙදවූ බවත් සඳහන් වේ.

- **චූලවංශයේ සාධක**

චූලවංශයේ සඳහන් වන ආකාරයට රන් ආලේප කරන ලද කුලුනුවලින් හා චිත්‍ර පටසළුවලින් අලංකාර කරන ලද සරස්වතී මණ්ඩපය නැටුම්, ගැයුම් සඳහා ඉදි කර ඇත. එහි රජුගේ හමුදාවේ සෙබළුන්ගේ ආස්වාදය උදෙසා නැටුම්, ගැයුම් කරවූ බව ද සඳහන් වේ.

පරාක්‍රමබාහු රජු නගර නිර්මාණයේ දී නාට්‍ය ශාලා ඉදි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව නාට්‍ය ශාලා පහක් ඉදි කරන ලද බව චූලවංශයේ සඳහන් වේ.

පරාක්‍රමබාහු රජු විසින් දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කිරීම සඳහා විශේෂ මණ්ඩපයක් සකස් කර, මණ්ඩපය වටා අලංකාර ආභරණ ගත ලා ගත් නළඟනෝ බොහෝ දෙනෙක් තබන ලදහ. එමෙන් ම බටනළා, වීණා සහ නොයෙකුත් බෙර වර්ග වාදකයන් යොදවා සිටි බව ද කියැවේ.

ඉතිහාස ගත තොරතුරු අනුව බලන කල බොහෝ රාජ්‍ය පාලකයෝ නැටුම්, ගැයුම්, වැයුම් සඳහා අනුග්‍රහය දක්වා ඇති බවත්, රාජකීය උත්සව සඳහා නැටුම්, ගැයුම්, වැයුම් යොදා ගෙන ඇති බවත් පැහැදිලි වන කරුණකි. එමෙන් ම

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

බෞද්ධාගමික උත්සව සඳහා නැටුම්, ගැයුම්, වැයුම් යොදා ගෙන ඇති අතර බෞද්ධාගම නිසා නැටුම්, ගැයුම්, වැයුම් පෝෂණය වී ඇති බව ද පෙනේ.

ඉහත සඳහන් තොරතුරු අධ්‍යයනය කර අවසානයේ තව තවත් තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් දළ සටහන සම්පූර්ණ කරන්න. එහි දී පෙනෙනුයේ වංශ කථා, දේශාටන වාර්තා මහාවංශය, චූලවංසය ආදී වාර්තාවල සඳහන් තොරතුරු එකිනෙකට ගැළපෙන බවයි. මෙහි වංශකථා, දේශාටන වාර්තා හා ඒ හා සම්බන්ධ රජවරුන් පිළිබඳ තොරතුරු පළමු හා දෙවෙනි වගුවලින් පෙන්නුම් කර ඇත. තුන්වන වගුව සම්පූර්ණ කිරීමෙන් ඒ ඒ රජවරුන් නර්තන කලාව භාවිත කළ අයුරු පැහැදිලි කර ගත හැකි ය.

| වංසකථා හා දේශාටන වාර්තා | දායක වූ රජවරුන් හා විදේශ සංචාරකයන් | නර්තනය භාවිත කළ අයුරු |
|---|---|---|
| මහාවංශය | පණ්ඩුකාභය රජු | • ......................<br>• ...................... |
| | දුටුගැමුණු රජු | • ......................<br>• ...................... |
| | මහාදළියාමාන රජු | • ......................<br>• ...................... |
| | භාතිකාභය රජු | • ......................<br>• ...................... |
| | මහා පරාක්‍රමබාහු රජු | • ......................<br>• ...................... |
| චූලවංශය | පරාක්‍රමබාහු රජු | • ......................<br>• ...................... |
| විදේශීන් දුටු පුරාණ ලංකාව | ඉබන් බතූතා | • ......................<br>• ...................... |
| වාර්තාව | ස්පිල් බර්ජන් | • ......................<br>• ...................... |
| එදා හෙළදිව | රොබට් නොක්ස් | • ......................<br>• ...................... |

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)